

# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## වසරක අවසානය

අපි තවත් වසරාවසානයකට එළැඹ සිටින්නෙමු. සම්ප්‍රදායික සුබපැතුමින් පරිසරය පිරී යන කාලයයි මේ. හිස් වදනින් කෙරෙන සුබ පැතුමකට වඩා ගෙවුණ වසරේ අප ලබාගත් දේ පිළිබඳව ආවර්ජනයක යෙදෙන්නැයි ආරාධනා කරන්නට අපි කැමැත්තෙමු. ගෙවුණ වසරේ අපට වැරදුන තැන් සොයාගන්නට හැකි නම් ඒ සියල්ල එළැඹෙන වසරේදී නිවැරදි කරගන්නට අපට හැකි වනු ඇත.

## හොරු රකින දේශපාලුවන් පන්නා දමනු

ඇවන්ට් ගාඩ් නම් වන සමාගමේ බූවලු අඬු වලට අසු නොවුණ දේශපාලකයකු ශ්‍රී ලංකාවේ නැති තරම් යයි කියැවෙයි. පසුගිය රජයේ ලොක්කන් හා එක්ව අවි ආයුධ ජාවාරමේ යෙදෙමින් ශ්‍රී ලංකා රජයට ලැබිය යුතු වූ කෝටි ගණනක මුදල් තම තමන්ගේ සාක්කු වලට පුරවාගත් මේ සමාගමට එරෙහිව කෙරෙමින් පවතින පරීක්ෂණ අඩාල කිරීම සඳහා කිසිදු හිරිකිතයකින් තොරව ප්‍රසිද්ධියේ පෙනී සිටින දේශපාලකයන් දැකීමත් අවාසනාවකි. මේ සමාගම ආරක්ෂා කරගන්නට වෙර දරන දේශපාලකයන්ගේ සැබෑ ස්වරූපය හෙළිදරව් කරමින් ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා මාධ්‍ය වලට නිකුත් කළ සේයා රූ පිළිබඳව ජනාධිපතිවරයා හා අගමැතිවරයා කුමන පියවරක් ගන්නේ දැයි ජනතාව දැන් බලා සිටිති.

ජනාධිපතිවරයා හා අගමැතිවරයා තමන්ගේ ආණ්ඩුවේ ඇමතිකම් දරන මේ හොරුන් වහාම පන්නා දමනවාද නැත්නම් තව දුරටත් මේ අපවිත්‍ර මිනිසුන් ආරක්ෂා කර තමනුත් වලට වැටෙනවාද යන්න ඉදිරි දින සති හෝ මාස කීපය විසින් තීරණය කරනු ලබනු ඇත.

සාධාරණ හා සදාචාරාත්මක සමාජයක් වෙනුවෙන් පෙනී සිටින රජයට මේ හොරුන් සමග ඉදිරි ගමනක් තිබිය නොහැකිය. ආණ්ඩුව ඇතුළේ සිට දූෂිත මුදලාලි පැලැන්තිය රකින දූෂිත දේශපාලකයන් යනු රටට සාපයකි. ඒ සාපයෙන් රට ගලවාගෙන තමනුත් ගැලවෙන්නට රජය කරවනා ඇත්තන් වග බලා ගත යුතුය. මහජනතාව ජනවාරි 8 වනදා දිවි පරදුවට තියා දූෂිතයන් රැළක් පන්නා දැමුවේ තවත් දූෂිතයන්ට පාර කපා දෙන්නට නොවන බව සිහියේ තබා ගැනීම කාට කාටත් සුබදායකය.



# ජීවත් වීමේ බලපත්‍රය අහිමි විදෙස් ගත ශ්‍රමිකයන් හා වාහන බලපත්‍රය ඉල්ලන ලාංකික ශ්‍රමිකයන්

**කේ ජී පිලිප් ශාන්ත**



ශ්‍රී ලාංකා ආර්ථිකයේ වැඩියෙන්ම විදේශ විනිමය නිෂ්පාදනය කරන්නා වූ ක්ෂේත්‍රයන් තුන වන්නේ විදේශ ගත ශ්‍රමිකයන්, ඇගළුම් කර්මාන්තය හා වැවිලි ක්ෂේත්‍රයයි. ඒ අතුරුන් වැඩියෙන්ම විදේශ විනිමය ගෙන එන්නේ විදේශ ගත ශ්‍රමිකයන් ය. 2014 වර්ෂයේ සංඛ්‍යාලේඛනයන්ට අනුව එලෙස රැකියා සදහා විදේශ ගත ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව 300,413ක් වන අතර ඔවුන් උපයා මෙරටට එවා ඇති මුළු මුදල ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 6,407කි. ඉන් ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 3,562ක් මැදපෙරදිග රටවල සේවය කරන්නන්ගෙන් වන අතර එය මුළු විදේශ ශ්‍රමික ඉපැයීම් වලින් 55.6%කි.

ඒ අනුව විදේශ ගත ශ්‍රමිකයන් උපයන විනිමයෙන් වැඩි ප්‍රමාණයක් මැදපෙරදිග රටවල සේවයේ යෙදී සිටින ශ්‍රමික කාන්තාවන් විසින් උපයන විදේශ විනිමය යැයි කීවොත් වඩා නිවැරදිය. විදේශ ඉපයීම් වලින් දෙවන හා තෙවන ස්ථානයන් ගන්නා ඇගලුම් ක්ෂේත්‍රයේ හා වතු ක්ෂේත්‍රයේ ඉපයීම් වලට ද වැඩි සම්මාදමක් ඇත්තේ කාන්තාවන් ය. ඒ අනුව විදේශ විනිමය ඉපයීමේ ලා වැඩි බරක් දරන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන් වන අතර මෙරට ආර්ථිකය කාන්තාවන් මත පදනම් වූවක් බව නිරීක්ෂණය කළ හැකිය.

ශ්‍රී ලංකා ආර්ථිකය විදේශ ගත ශ්‍රමිකයන්ගේ ඉපයීම් මත තීරණයවීම ආර්ම්භවූයේ 1978 දී වෙළෙඳ පළ ආර්ථිකයකට ප්‍රවේශවීමත් සමගය. ආරම්භයේ දී එලෙස ශ්‍රමිකයන් විදේශ ගත වීම බහුල ලෙස සිදුවූයේ කාන්තාවන් ගෘහසේවිකාවන් ලෙස මැදපෙරදිග රටවල් කරා ඇදී යෑමෙනි. එහෙත් ඒ තත්ත්වය දැන් ක්‍රමිකව වෙනස් වෙමින් පවතී. මැ-

12 වන පිටට